# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 ජුලි මස 17 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

01. ගරු නිරෝෂා අතුකෝරළ මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.07.03 වන දින අසන ලද ප්‍රශ්නය; [ප්‍ර/ VI(1)/18/31]

(අ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ආ) එයින් පළාත් පාසල්වල ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඇ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සමත් හා අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඈ) 2016 ට සාපේක්ෂව 2017 වසරේ සමත්,අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඉ) 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ගණිත විෂය සමත්,අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

(ඊ) 2016 වසරට වඩා මෙම වසරේ ගණිත විෂය සමත්, අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

02. ගරු එම්.එස්.එම්. ෆයිරුස් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.07.03 වන දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/VI/(1)/18/32)

(අ) රාමසාන් උපවාස මාසයේ මුස්ලිම් දේවස්ථානවලට රටඉඳි බෙදාදීමක් ඔබ අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ඉටු කරන්නේද?

(ආ) එම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ කවදාද ?

(ඇ) රටඉඳි බෙදීම සඳහා වාර්ෂිකව වෙන් වූ මුදල් ප්‍රමාණයන් හා බෙදූ රටඉඳි ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

(ඈ) ඒ ඒ වර්ෂයන්හිදි රටඉඳි බෙදා දුන් දේවස්ථාන හා ඒවාට ලබා දුන් රටඉඳි ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

(ඉ) රටඉඳි බෙදීමේ දී මුස්ලිම් දේවස්ථාන තෝරා ගැනීම සිදු කරනු ලබන ක්‍රමවේදය කුමක්ද?

(ඊ) එම ව්‍යාපෘතිය සඳහා රටඉඳි මිලදී ගනු ලබන ක්‍රමවේදය හා ඒ ඒ වර්ෂයන් හිදී මිලදී ගනු ලැබූ ආයතන කවරේද?

(උ) අදාල රටඉඳි නියමිත ලෙස අදාල දේවස්ථානවලට ලැබුණු බවට වන පසු විපරම් සහතිකය කුමක්ද?

03. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; [ප්‍ර/ VI(1)/18/35]

අ) ප්‍රවාහන අධිකාරියේ MM 1-1 ප්‍රාදේශීය කළමණාකාර තනතුරේ පුරප්පාඩු කොපමණ තිබේද? එම පුරප්පාඩු පවතින්නේ කුමන ස්ථානවලද?

ආ) එම පුරප්පාඩු පවතින්නේ කොපමණ කලක සිටද?

ඇ) දැනට එම පුරප්පාඩු වලට කුමක් සිදු වී ඇතිද?

ඈ) ප්‍රවාහන අධිකාරියේ MM 1-1 ප්‍රාදේශීය කළමණාකාර තනතුරේ වැඩ බලන තනතුරු කීයක් තිබේද?

ඉ) එම තනතුරුවල පත්වීම් ලබා දෙන්නේ කෙසේද?

ඊ) මෙම පත්වීම් ගරු ආණ්ඩුකාරතුමා විසින් අත්හිටුවා ඇති බව ඔබතුමා දන්නෙහිද?

උ) ගරු ආණ්ඩුකාරතුමා විසින් නව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පත්වීම් ලබාදීමට උපදෙස් ලබා දී ඇති බව දන්නෙහිද? ඒ අනුව එම උපදෙස් ක්‍රියාත්මක නොකරන්නේ මන්ද?

ඌ) මීට පෙර පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය නීති විරෝධි බැවින් එක් පුද්ගලයෙකුට පමණක්, එනම් හෝමාගම ප්‍රාදේශීය කළමණාකරු වානක මහතාට පමණක් එම තනතුර ලබා දුන්නේ කෙසේද?

එ) ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය මත එම පත්වීම් නතර නොකරන්නේ කුමන හේතුවක් නිසාද?

04. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; [ප්‍ර/ VI(1)/18/36]

අ) 1999 සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව මහරගම නගර සභාවේ තොග ශේෂය හා භෞතික තොග ශේෂය අතර වෙනස හා ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂ හා භෞතිකව පවතින වත්කම්වල අගයන් අතර වෙනස සම්බන්ධව විමර්ශනයක් කර ඇති බව දන්නෙහිද?

ආ) විමර්ශන වාර්තාවේ (i) අංක 06 යටතේ නිගමනවල 6.1 (iii) ට අනුව ලෙජරයේ ගිණුම් කැබීම් අතහැර දැමීමට තීරණය කර ඇති නිලධාරියා වංචා, දූෂණ, අක්‍රමිකතා ක්‍රියාවලියකට ඉඩ සැලැසීමේ අදහසින් එකී තීරණය ගෙන ඇති බවද,

(ii) 6.1 (ix) ට අනුව එකී කාලය තුළ ධුරයන් දැරූ සභාපතිවරයා, සභාපතිවරිය දීර්ඝ කාලයක් තුළ ඒ පිළිබඳව නොසලකා හැරීමෙන් තම වගකීම පැහැර හැර ඇති බවද, සඳහන් වන බව දන්නේද?

ඇ) සොයා ගත හැකි ලිපි ලේඛනවලට අනුව රුපියල් ලක්ෂ 400 ක මුදලක් වංචා, අක්‍රමිකතාවලට අනුව මහරගම ජනතාවට අහිමි වී ඇති බවත්, පරිත්‍යාග, ත්‍යාග ලෙස ලැබී ඇති දේවල වටිනාකමට අනුව මෙම අක්‍රමිකතාවල මූල්‍ය අගය තවත් ඉහළ බවත් පිළිගන්නේ ද?

ඈ) පළාත් පාලන ආයතන අධීක්ෂණයට ඇති බලතල අනුව මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග නවරේද?

05. ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; [ප්‍ර/ VI(1)/18/37]

අ) ඔබතුමා ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා ලෙස පත්වීමෙන් පසුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට කොපමණ සේවක පිරිසක් බඳවාගෙන තිබේද?

ආ) එලෙස සිදුකළ බඳවා ගැනීම් කවර තනතුරු සඳහාද?

ඇ) අදාළ පත්වීම් (ස්ථිර, තාවකාලික, කොන්ත්‍රාත්, ආදේශ හෝ වෙනත්) කවර පදනමකින් සිදු කලේද?

ඈ) බඳවාගත් පටිපාටිය පැහැදිලි කල හැකිද?

ඉ) ඇතමුන් නියමිත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නැති බව ඔබතුමා පිළිගන්නේද? නොඑසේනම් ඒ මන්ද?

## VII. පෞද්ගලික ප්‍රකාශ

## VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

## IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

## X. සභාවේ කටයුතු

<u>ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට</u>

යෝජනාව :

"අද දින (2018.07.17 දින) සභා න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 39(1), 39(3), හා 52(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."

## XI. පොදු කටයුතු

**01.** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) :

<u>යෝජනාව</u> :

<u>2018 පරිපූරක ඇස්තමේන්තුව - 02</u>

"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන්, එනම්,

- පළාත තුළ වැඩ අවසන් නොකළ පාසැල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළු අනෙකුත් ඉදිකිරීම් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම, ( රුපියල් මිලියන හත්සිය පනහක් - රු. 750,000,000)

යන අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් වන (රු. 750,000,000) මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබා ගැනීම මඟින් පියවා ගැනීමට අපේක්ෂිත වන හෙයින් ඒ අනුව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 අනුමත කළ යුතුය."

**02.** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) :

<u>යෝජනාව</u> :

<u>2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 ට අදාල විසර්ජන ප්‍රඥප්තිය</u>

"2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 02 සඳහා අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් (රු. 750,000,000) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත්, බලය දෙනු ලබන 2018 අංක ______ දරණ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."

## XII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා**

"බ්ලූමැන්ඩල් කුණු කන්ද, මීතොටමුල්ල කුණු කන්ද, කරදියාන කුණු කන්ද, වැනි කුණු කඳු කඩා වැටී මනුෂ්‍ය ජීවිතත්, සමස්ත පරිසරයත් ව්‍යසනයට පත් වෙද්දී ඒවාට වග කියන බලධාරීන්, ආයතන ,ඒවා වැළැක්වීමටත් ,ඒවාට ස්ථිර සාර විසඳුම් යොදන බවත්, කියමින් නොයෙකුත් පුරසාරම් දොඩන ලදී. මීතොටමුල්ල කුණු කන්දත්, බ්ලූ මැන්ඩල් කුණු කන්දත් නාගරික උද්‍යාන බවට පත් කරන බවට ප්‍රකාශ කරන ලදී. තවමත් එම කුණු කඳු එසේම පවතී. දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් නොමැත. කැළණි ගඟ වසරක් පාසා පිටාර ගලද්දි ඒවාට යට වන ජනතාවට එම අවස්ථාවේ දී බත් පැකට්ටුවක්, වියළි ආහාර ටිකක් බෙදා දී තාවකාලිකව සමනය කරනු ඇත. මෙම සියළු ව්‍යසනයන්ට ඒ ඒ විෂයන් අයත් අමාත්‍යාංශ මැදිහත්ව ,දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ සභාව යෝජනා කර සිටියි."

[යෝ/VI(1)/18/04]

**02. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා:**

"බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවනු ලැබ ඇති විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඉගෙනුම ලබන පාසල් සංඛ්‍යාව 182 ක් පමණ වන අතර, එම පාසල් වල ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාව 3713 කි.

රජයේ පාසල් වල ඉගෙනුම ලබන සාමාන්‍ය දරුවන්හට 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍ය ආධාර මුදලක්ද, විශ්ව විද්‍යාල සිසුන්හට මහපොළ ශිෂ්‍යත්වය මඟින් ශිෂ්‍ය ආධාර මුදලක්ද, ලබා දීමේ ක්‍රමයක් පැවතිය ද, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්හට ශිෂ්‍ය ආධාර මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත.

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දෙන පාසල් වල ඉගෙනුම ලබන දරුවන් දිරි ගැන්වීම සඳහා එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යම් දීමනාවක් හෝ ආධාර මුදලක් ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

[යෝ/VI(1)/18/05]

## XIII. සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.එක්. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.07.04 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල - B පර්යන්තය,
සෙත්සිරිපාය.
බත්තරමුල්ල.